14. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍ර මඟින් හෝ වෙනත් ලෙසකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

## 26. උළු සහ ගඩොල් පෝරණු.

01. 1.1 මෙම කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය නිසා ජනිතවන ශබ්දය අදාල ඉඩමේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර සේවා කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර සේවා කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුගයෙන් තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොකර නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

1.2 යන්ත්‍රසූත්‍ර ක්‍රියාකාරීමේදී ඇති වන ශබ්දය සීමාවට පැවතීම අනුකූලවීම සඳහා එම ක්‍රියාවලි නිසිලෙස ආවරණය කරන ලද ස්ථානයක සිදු කළ යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරිත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය :-(solid wastes):-

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු සකල හෝ පොලිතීන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුල හෝ වටපිටාව තුල එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 ඝන සහ අර්ධ ඝන අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කල යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කල යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කල යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / රැගෙනයාම සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය පාලනයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 උළු /ගඩොල් නිෂ්පාදනයේදී ජනනය වන අපද්‍රව්‍ය කුඩා අංශුමාත්‍රවලින් පරිසරයට මුදා නොහැරිය යුතු අතර, ඒවා සුදුසු පරිදි වැලි වල රඳවා පිරිසහ කර නැවත භාවිතා කල යුතුය.( උදා:- ගන්ධ පෙදිම වැනි)

3.2 කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී පිටවන මලකට අපද්‍රව්‍ය විධිමත් ලෙස සකස් කළ සෙප්ටික් ටැංකි උරා ගැනීමේ වලකට (soakage pit)යොමු කළ යුතු අතර , කුඩා අංශුමාත්‍රවලින් වියළා පරිසරයට නිදහසේ මුදා නොහැරිය යුතුය.

04. 4.1 හදිසි අවස්ථාවන්දී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ පහසුවෙන් ගත හැකි පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා පහසුවෙන් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය

4.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අනතුරක් හටගත්හොත්, හදිසි අවස්ථාවක ගිනි නිවීම වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවීම බලධාරීන් වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

05. උළු සහ ගඩොල් පිළිස්සීම සඳහා භාවිතා කරන පෝරණුවේ චිමිනිය අවම වශයෙන් අඩි 30 ක හෝ ආසන්නතම උසම ගොඩනැගිල්ලේ වහලයේ මට්ටමට වඩා අඩි 08 ක් උසට තිබිය යුතුය.

06. 6.1 අමුද්‍රව්‍ය ගොඩගැසීම හා පැටවීමේදී වාතයට දූවිලි එක් වීම පාලනය කල හැකි ක්‍රමවේද අනුගමනය කල යුතුය.

6.2 භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී පිටවන දූවිලි අවම වන අයුරින් දූවිලි පාලන උපක්‍රම භාවිතා කල යුතුය

6.3 අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම් හෝ ආවරණය කරන ලද වාහන වලින් පමණක් සිදු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

6.4 අමුද්‍රව්‍ය එක් කර තබා ගැනීමේදී ජල මාර්ග අවහිර වීමට හා මතුපිට ජලය ගලා බැස යාමට අවහිර නොවන පරිදි ගබඩා කල යුතුය.

6.5 නිමි භාණ්ඩ විවෘත ස්ථාන වල ගබඩා කිරීමේදී ජලය නොරැඳෙන පරිදි ගබඩා කිරීමට සැලකිලිමත් විය යුතුය.

07. කර්මාන්තය තුළ මනා ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

08. .......... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. .......... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

10. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස දැනට පවතින ඕනෑම හෝ අනාගතයේ පරිසර දූෂණ තත්වයක් මැඩ පවත්වා ගැනීම පිණිස මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභියා සෑම විටම බැඳී සිටිය යුතු ය.

11. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධයට නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාල ඉඩම්හිමි අනුකූලව අයදුම්/ අයිතිය සිදු වීම හා පරිසරයට හානිදායක හා කඩිනම් පිළිකිරීමට පමණක් වගින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

13. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

14. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එකී ක්‍රියාකාරකම් කරනු ලබන ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

15. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**27. විදුලි ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව විදුලි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා පිටවන ශබ්දය අදාල ඉඩමේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර දහවල් කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර රාත්‍රී කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම අනුසාරයෙන් නිර්ණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය :-(solid wastes):-

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 සහ 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු සියලු හෝ කොටසකින් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ පරිසරය තුළ එළිමහනේ පිළිස්සීමට ගැලපීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කළ යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මැදිහත්වීම යටතේ බැහැර කළ යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / ප්‍රතිචක්‍රීකරණය සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන විසින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රමවේදයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 විදුලි කාන්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී සිසිලනය සඳහා භාවිතා කරන ජලය කිසිවිටකත් බාහිර පරිසරයට මුදා නොහැරිය යුතු අතර නැවත භාවිතා කිරීමට පියවර ගත යුතුය.

3.2 කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී පිටවන අපජලය ආරක්ෂිත විධිමත් ලෙස සකස් කළ සෙප්ටික් ටැංකි උරා ගැනීමේ වළකට (soakage pit)යොමු කළ යුතු අතර , කිසිම අවස්ථාවකදීවත් පිටත පරිසරයට නිදහසේ මුදා නොහැරිය යුතුය.

04. 4.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම උපකරණ සෑම ගොඩනැගිල්ලකම පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා පහසුවෙන් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය.

4.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි නිවීම වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක විසින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

05. පොල්කටු කුළුණේ චිමිනිය අවම වශයෙන් අඩි 30 ක හෝ ආසන්නතම උසකින් ගොඩනැගිල්ලේ වහලයේ මට්ටමට වඩා අඩි 08 ක් උසට පිහිටිය යුතුය.

06. කර්මාන්තය තුළ මනා ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

07. .......... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසිදු වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

08. .......... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස යම් හානිකර තත්ත්වයක් හෝ අහිතකර පරිසර දූෂණ තත්වයක් ඇති වන්නට හැකිබව පෙනී ගිය විට මෙම බලපත්‍ර පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු හැම විටම බැඳී සිටිය යුතු ය.

10. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාළ භූමියට අනුකූලව අයිතිය/ අයිතියක් පිළිගැනීම හා පරිසරයට හානිදායක හා ශබ්දය පිටකිරීමට පමණක් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම බලපත්‍ර පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

11. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාළ බලපත්‍රයේ මුල් පිටපත මෙම බලපත්‍ර පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

13. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එම කාලයත් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එකී ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

14. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මඟින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම බලපත්‍ර පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

## 28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාළ භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 න් පස්වරු 06.00 න් අතර දිවා කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 න් පෙරවරු 06.00 න් අතර රාත්‍රී කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාළ වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියමයන් පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුයෙන් තීරණය කර අදාළ ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම් දිවා කාලයට පමණක් පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක පෝෂණාගාරයේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය :-(solid wastes):-

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට ඇතුළුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පොලිතීන් ඇතුළු වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට, පුළුස්සීමට ඉඩදීම හෝ සිදුකිරීම තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කල යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කල යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය ඒමගින් අදාල පළාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කල යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා ප්‍රවාහන පහසුකමට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා මැස්සන් බෝවීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රමවේදයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 කළු ගල් කැඩීමේදී හා ඔප දැමීමේදී දූවිලි නිකුත් වීම අවම කිරීම සඳහා ජලය ඉසින උපකරණයක් අදාල ස්ථානයේ සවි කල යුතුය.කළු ගල් කැඩීම, ඔප දැමීම සිදු කරන සෑම විටම එම ඉසිනය ක්‍රියාකාරීව පැවතිය යුතුය.ඒ සඳහා පවතනයක් ලොග්පොතක් පවත්වා ගත යුතුය.මෙම ලේඛනය අදාල පළාත් පාලන ආයතනය හෝ මධ්‍යම පරිසර අධිකාරියේ/ රජයේ නියාමන ආයතනයක පරීක්ෂාව සඳහා කර්මාන්ත පරිශ්‍රයේ තැබිය යුතුය.

3.2 කළු ගල් ඇඹරීමේදී හා ඔපදීමේදී අපද්‍රව්‍ය / ජලය බැහැර කිරීමට පද්ධතියක් පවත්වාගෙන යා යුතු අතර, එමගින් ප්‍රශ්ණ ඇතිවීම පාලනය කල යුතුය.

3.3 ශබ්ද තරංගයන් වලින් හා කම්පනය දූෂණය පිටවීම අඩු කිරීමට කර්මාන්තය සහිත භූමිය වටා ආවරණ වැටක් (ශබ්ද බාධකයක්) ඇති කල යුතුය.

3.4 කළු ගල් ප්‍රවාහනය කිරීමේදී කොළින් ආවරණය කරන ලද වාහන වලින් පමණක් සිදු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

3.5 කළු ගල් කැඩීමේදී හා ඔප දැමීමේදී ඇති වන ගල් කුඩු අවට පරිසරය වෙත යොමු වීම පාලනයට අවශ්‍ය පියවර ගත යුතු අතර කම්කරුවන් මගින් අවට කොළඹපැතිලි, නිවාස වලට ඇතුළු නොවීමට හා සනීපාරක්ෂක ගැටළු ඇති වීම වැළැක්වීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

04. කර්මාන්තය තුළ නිසි ජල පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

05. 5.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ සෑම විටම පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයින් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය

5.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි ඇතිවීම වැනි ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවීම ප්‍රජා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

06. ...... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ සීමාව වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

07. ....... දිනැති අයදුම්පතේ සඳහන් පෝෂකයන්ට අතිරේකව වෙනත් පෝෂක යෙදීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

08. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස යම් හානිය හෝ අන්දමේ පරිසර දූෂණ තත්වයක් ඇති වන්නට ඉඩ ඇත්නම් මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු හට බැඳී සිටිය යුතු ය.

09. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාල භූමියට අනුකූලව ආදායම්/ අයිතිය ලබා ගැනීම හා පරිසරයට විදුලිකරණය හා ශබ්දය පිටකිරීමට තමන්ගේ වටින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

10. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

11. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු වගබලා ගත යුතු ය.

12. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එම ස්ථානයේ අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එම ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

13. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් මඟින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු.**

01 මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 න් පස්වරු 06.00 න් අතර සේවා කාලය තුළ ඩෙසිබල් ..... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 න් පෙරවරු 06.00 න් අතර සේවා කාලය තුළ ඩෙසිබල් ..... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු: අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ඝෝෂා පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ඝෝෂා මට්ටම ආශ්‍රයෙන් තීරණය කර අදාල ස්ථානයේ කලාපයන්, කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොකරයි නම් ශබ්ද මට්ටම දිවා කාලයට පමණක් පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය :-(solid wastes):-

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසල හෝ පොලුමෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 හැකි තරම් අවස්ථාවන්හිදී අපද්‍රව්‍ය ගොනුව වන ස්ථානයේදීම වෙන්කළ යුතු අතර, වෙන්කළ ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කළ යුතුය.

2.6 කර්මාන්තයෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර ප්‍රශ්නයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / සැකසීමට සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය තත්වයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. ගල්වලේ කැණීම් භූමිය සැකසීමේදී පස් හා ගස ආවරණ ඉවත් කිරීමේදී පාරිසරික හානි අවම වන ලෙස සිදුකළ යුතුය.

04. 4.1 එක් වරකදී එක් කෝර වලක් පමණක් පිපිරවීම කළ යුතුය.

4.2 කෝරවලක උපරිම ගැඹුර .............. නොඉක්මවිය යුතුය.

4.3 කෝර වලවල් කැපීම සඳහා යන්ත්‍ර භාවිතා නොකළ යුතුයි.

4.4 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය නිකුත් කරන ලද අංක .......... දරණ බලපත්‍රයේ කොන්දේසි වලට අනුකූලව ගල් වලේ ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යා යුතුය.

05. 5.1 මිලදී ගත් පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය, දිනපතා පිපිරවීම් වලට භාවිතා කළ පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉතිරි ප්‍රමාණය දිනපතා පුපුරවන ලද කෝර වලවල් ගණන පිළිබඳ දත්තයන් අඩංගු ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

5.2 පුපුරණ ද්‍රව්‍ය භාවිතා කිරීමේ දී සහ ගබඩා කිරීමේදී අදාල ආයතන මගින් පනවා ඇති නීති රීති වලට අනුකූල විය යුතුය.

06. මෙම ගල්වලේ වෙඩි තැබීමේදී ඇති වන භූ කම්පනය උපරිම අංශු ප්‍රවේගය තත්පරයට මිලි මීටර් 4 (04mm/ sec) හා වාතයේ පිපුරුම් අධි පීඩන තරංග ඩෙසිබල් (රේඛීය උපරිම) 115dB (Linear peak) හා නොඉක්මවිය යුතුය.

07. කර්මාන්තය තුළ මනා ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

08. පුපුරණ ද්‍රව්‍ය යොදා ගල් පිපිරවීමේදී කිසිඳු පුද්ගලයෙකුට හෝ වාහනයකට හෝ දේපලකට හානියක් නොවීමට වගබලා ගත යුතුය.

09. 9.1 ගල්වලේ ක්‍රියාකාරිත්වයේදී ඇති වන ගල් කුඩු සහිත ජලය පරිසරයට, පසට, කුඹුරුවලට මිශ්‍ර වීම හෝ ගල්වලේ ක්‍රියාකාරිත්වය නිසා සිදු වන පාංශු ඛාදනය වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.

9.2 කෝර පිපිරවීමේදී ගල් කැබලි විසි වීම වැළැක්වීම සඳහා වැට හෝ දැල් යෙදීම කළ යුතුය.

10. ගල් වලේ ක්‍රියාකාරිත්වයේදී ඇති වන භූ කම්පනය හා අනෙකුත් පාරිසරික හා සමාජීය බලපෑම් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

11. ගල් කැඩීමෙන් පසුව ඇති වන වලවල් ජලය නොරැඳෙන පරිදි ඒවා හොඳින් වසා දැමිය යුතුය.ඒ සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම පළාත් පාලන ආයතනය පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

12 ද්විතීයක පිපිරවීම් හැකිතාක් දුරට අඩුවෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගතයුතුය . එනම් ප්‍රාථමික පිපිරවීම් වලදී විශාල ගල් කුට්ටි නොලැබෙන පරිදි පිපිරවීම් සැළසුම් කිරීමට වග බලා ගත යුතුය.

13. වෙඩි පිපිරවීමට පූර්ව,පසුවින් නාලයක් මඟින් හෝ වෙනත් සුදුසු ක්‍රමයක් මඟින් පූර්ව දැනුම් දීමක් කළ යුතුය.

14. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එක් වරකට එක් සිදුරක් ඇතිව පුපුරවීම් මසකට ඝන මීටර 600 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු, මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරන කැණීම් සඳහා පමණි.

15. ගල් වළවල් වැඩ කරන සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කර්මාන්තශාලා ආඥා පනතේ හා එහි සංශෝධනයන්හි අඩංගු නීති හා රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය.

16. .......... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

17. .......... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

18. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස යම් හානිකර තත්ව හෝ අන්තරාදායක පරිසර දූෂණ තත්වයක් ඇති වන්නේ නම් මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු සැම විටම බැඳී සිටිය යුතු ය.

19. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය මඟින් නිකුත් කරනු ලද කැණීම් බලපත්‍රය වාර්ෂිකව අවසන් වන දින සිට සති දෙකක කාලයක් තුළ නව බලපත්‍රය පළාත් පාලන ආයතනය වෙත වරින් වර ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් මෙම බලපත්‍රය කැණීම් බලපත්‍රය වලංගු වන දින දක්වා පමණක් වලංගු වේ.

20. මෙම ක්‍රියාකාරීත්වය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමඟින් අදාළ පුද්ගලයාට අනුකූලව අයිතිය/ අයිතියක් මුදා හැරීම හා පරිසරයට විශුද්ධතාවය හා සෞඛ්‍ය පිරික්සීමට පමණක් එකීන් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

21. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

22. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාළ බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

23. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරියේ කිරීමට අදහස් නොකළ යුතුය.

24. කර්මාන්තකරු විසින් සාධාරණ ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කිරීමෙන් හෝ වෙනත් අනුමැතිය ලබා ඇති යම් යෝජනාවක් අනුගමනය කර / හෝ වැරදි සහ කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් සාධාරණ ආරක්ෂණ පිළිවෙත් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ සීමාවේදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර දිවා කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර රාත්‍රී කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ශ්‍රී ලංකා 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති සීමාවන් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම අනුයෙන් නිර්ණය කර අදාල ස්ථානයේ කලාපය, කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි වෙනස් විය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් ආශ්‍රිත කසල හෝ පොලිතීන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 දහයිය කපන්නන් නාම ය් සඳහා කුඩුකුටීරයක් සහිත කරන ලද දුම්කවුළුවක් ස්ථාපිත කළ යුතුයි. එම චිමිනිය අවම වශයෙන් අඩි 30ක් හෝ ආසන්නතම උසම ගොඩනැගිල්ලේ වහලේ මට්ටමට වඩා මීටර් අඩි 8ක් උසකින් යුතු කළ යුතුය.

2.5 අදාල ස්ථානයේ හෝ ඉන් පිටතට මිනි පොළව ගොඩකිරීම සඳහා ලී කුඩු යොදා නොගතයුතු අතර, මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.6 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන් කළ යුතු අතර, වෙන්කළ ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.7 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මාර්ගෝපදේශ යටතේ බැහැර කළ යුතුය.

2.8 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය

2.9 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය පහසුකම් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී පිටවන අපජලය අනුමත විධිමත් ලෙස සකස් කළ සෙප්ටික් ටැංකියක් ඇතුළු උරා ගැනීමේ වළකට (soakage pit) යොමු කළ යුතු අතර, කිසිම අවස්ථාවකදීවත් පිටත පරිසරයට නිදහසේ මුදා නොහැරිය යුතුය.

04. කර්මාන්ත ක්‍රියාවලියෙන් පිටවන සියලුම ලී කුඩු අවට පරිසරයට එකතුවීම වැළැක්වීමට විධිමත් පියවර ගත යුතුය.

05. කර්මාන්තය තුළ මනා ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

06. 6.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ සොයා ගතහැකි පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයින් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය

6.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි ඇතිවීම වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

07. මෙම කර්මාන්තයේ වැඩ කරන සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කර්මාන්තශාලා ආඥා පනතේ හා එහි සංශෝධනයන්හි අඩංගු නීති හා රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය.

08. ........... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරිත්වයේ කිසියම් වෙනස්කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම බලපත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. ........... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම බලපත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

10. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි කුමන හෝ ආකාරයක පරිසර දූෂණ තත්වයක් මැඩ පැවැත්වීම පිණිස මෙම බලපත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු සෑම විටම බැඳී සිටිය යුතු ය.

11. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාල භූමියට අනුකූලව අයිතිය/ අවසරය හිමි වීම හා පරිසරයට විසර්ජනය හා ශබ්දය නිකුත් කිරීමට පමණක් එමගින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම බලපත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ....... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

13. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම බලපත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

14. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අයිතම යටතේ ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදාළ නොකළ යුතුය.

15. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍රය මගින් හෝ වෙනත් අයුරකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම බලපත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**31.** **දැව පදම් කිරීම සඳහා බොයිලර්වලින් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර දහවල් කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.0 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම 0 ත් අතර රාත්‍රී කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති වල දක්වා දිය හැකි උපරිම ශබ්ද මට්ටම් ආශ්‍රයෙන් තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසළ හෝ ශාකමූලයන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට ඇලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 දහනය කරන්නේ නම් ඒ සඳහා සුමතානුකූල සකස් කරන ලද දහනකයක් භාවිතා කළ යුතුයි. එහි චිමිනිය අවම වශයෙන් අඩි 30ක් හෝ ආසන්නතම උසම ගොඩනැගිල්ලේ වහලේ මට්ටමට වඩා මීටර් අඩි 8ක් උසකින් මුදා හල යුතුය.

2.5 අදාල ස්ථානයේ හෝ ඉන් බැහැරව සිම් ගොඩගැසීම් සඳහා ලී කුඩු පොදා නොතැබිය යුතු අතර , මෙම බලපත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.6 හැකි හැම අවස්ථාවන්හිදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන් කළ යුතු අතර , වෙන්කළ ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.7 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල බලපත් පාලන ආයතනයේ මඟපෙන්වීම යටතේ බැහැර කළ යුතුය.

2.8 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම බලපත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය

2.9 ද්‍රව්‍යන්ගේ ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය පාලනයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 දැව පදම් කිරීම සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය මිශ්‍ර ද්‍රාවණය නැවත භාවිතා කළ යුතු අතර,බැහැර කිරීමට අවශ්‍ය වන්නේ නම්, එම අපද්‍රව්‍ය ජාතික පාරිසරික පනතින් නිර්දේශිත *(ඩී අභ්‍යන්තර ජලාශ වලට මුදා හරින කාර්මික අපජලය සඳහා වන ධාරණ සීමාවන්/ වාරිමාර්ග කටයුතු සඳහා භාවිතා කරනු ලබන භූමි වලට මුදා හරින කාර්මික අපජලය සඳහා ධාරණ සීමාවන්ට අනුකූලව පිරිපහදු කර පමණක් මුදා හැරීම සිදු කළ යුතුය.

සැ.යු. *අදාල වන ධාරණ සීමා වර්ගය පමණක් තීරණය කොට ඇතුලත් කරන්න.

3.2 කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් පිටවන සනීපාරක්ෂක අපද්‍රව්‍ය පිළිගත් ලෙස සකස් කළ සෙප්ටික් ටැංකි සහ උරා ගැනීමේ වළකට (soakage pit) යොමු කළ යුතු අතර , කිසිම අවස්ථාවකදීවත් පිටත පරිසරයට නිදහසේ මුදා නොහැරිය යුතුය

04. 4.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ ආයතන පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයින් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය.

4.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි ගැනීම් වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ පුහුණුව සහ උපදෙස් අදාළ ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

05. පදම් කරන ලද දැව වියළීම සඳහා දුම් ගැසීම ක්‍රියාවලිය සිදු කරන්නේ නම් එම පෝරණුවේ චිමිනිය අවම වශයෙන් අඩි 30 කට වඩා උස විය යුතුය.

06. කර්මාන්තය තුළ නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

07. මෙම කර්මාන්තය තුළ වැඩ කරන සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කර්මාන්තකරුවා අදාළ කම්කරු හා ඒ ආශ්‍රිත කාර්යාලයන්හි අදාළ නීති හා රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය.

08. .......... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරිත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම බලපත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. .......... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම බලපත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

10. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින කුමන හෝ අන්දමේ පරිසර දූෂණ තත්වයක් හැඩ පවත්වා ගැනීම පිණිස මෙම බලපත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කර්මාන්තකරු තම වියදමින් බැඳී සිටිය යුතු ය

11. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමඟින් අදාළ ප්‍රමිතීන්ට අනුකූලව අපජලය/ අපද්‍රව්‍ය මුදා හැරීම හා පරිසරයට වායු දූෂකයන් හා ශබ්දය පිටකිරීමට පමණක් එමගින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම බලපත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

13. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාළ බලපත්‍රයේ මුල් පිටපත මෙම බලපත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

14. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට යොදා නොගත යුතුය.

15. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මඟින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව තීරණය කරන අවස්ථාවක

අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

## 32. මිශ්‍ර කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත.

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාළ භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර දිවා කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර රාත්‍රී කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාළ වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග සමඟ 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් ආශ්‍රයෙන් තීරණය කර අදාළ ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම් දිවා කාලයට ගැලපෙන සේ යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට ඇතුළුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසළ හෝ සාමාන්‍යයෙන් දැවිය හැකි වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට පුළුස්සීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කල යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාළ පළාත් පාලන ආයතනයේ මඟපෙන්වීම යටතේ බැහැර කළ යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා පුද්ගලික කාර්යයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාළ ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය තත්වයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. කර්මාන්ත ක්‍රියාවලියෙන් ජනිත වන ලී කුඩු වෙනත් කර්මාන්තයකට භාවිතය සඳහා ලබාදෙන්නේ නම් එය නිසි ආවරණය කරන ලද වාහන වල පිටකළ යුතු අතර, ලී කුඩු ආදියෙන් අසල්වාසී නිවැසියන්ට හිරිහැරයක් නොවන ආකාරයෙන් එය සිදු කිරීමට වග බලා ගත යුතුය.

04. සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී ජනිත වන සියළුම ගෘහාශ්‍රිත අපද්‍රව (domestic liquid waste) නිසි ලෙස සකසන ලද සෙප්ටික් ටැංකි/ උරා ගැනීමේ වළකට (soakage pit) යොමු කළ යුතු අතර, කිසිම විටෙක නිදහසේ විවෘත පරිසරයට මුදා නොහැරිය යුතුය.

05. කර්මාන්ත ක්‍රියාවලියේදී ජනිත වන ලී කුඩු ආදිය පරිසරයට විසුරුවීමට එකතු වීම වැළැක්වීම සඳහා විධිමත් පියවර ගත යුතුය.

06. 6.1 ඝන අපද්‍රව්‍යයන්දී බැහැර කළ හැකි පරිදි ප්‍රමාණවත් බිනි බඳුන් උපකරණ සහිත ගබඩා පරිශ්‍රයක් තිබිය යුතු අතර, ඒවා පසුකාලීනව බැහැර කළ හැකි පරිදි තබා ගත යුතුය.

6.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, ගිනි අවස්ථාවක ගිනි නිවීම වලදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

07. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය වඩු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5ට වැඩි 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති ආශ්‍රිත කර්මාන්ත සඳහා පමණක් වලංගු වේ.

08. කර්මාන්තය තුළ නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

09. .......... දිනැති ගැසට් පත්‍රයෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

10. .......... දිනැති ගැසට් පත්‍රයේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

11. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස පසු කාලීනව කුමන හෝ අන්දමකින් පරිසර දූෂණ තත්වයක් මතු වන්නට ඇතිවීම නිසා මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා විසින් වරින්වර ලබා දෙන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු හැම විටම බැඳී සිටිය යුතු ය.

12. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන හෙයින්ද, මෙමගින් අදාල ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය/ අපජලය මුදා හැරීම හා පරිසරයට වායු දූෂණය හා ශබ්දය නිකුත් කිරීමට පමණක් මෙයින් බලය ලැබෙන හෙයින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

13. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ....... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

14. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

15. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අයිතමයට අදාළ ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එකී ක්‍රියාකාරකම් කරනු ලබන ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

16. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් අයුරකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව තීරණය කිරීමේ අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

33. **සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින සේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර දිවා කාලය තුල ඩෙසිබල් ...... හෝ ඊට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර රාත්‍රී කාලය තුල ඩෙසිබල් ...... හෝ ඊට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුගයෙන් තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසල හෝ පොලිතීන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුල හෝ වටපිටාව තුල එළිමහනේ පිළිස්සීමට හැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කල යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කල යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කල යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා පුද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා මැස්සන් බෝවීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 මුළුතැන්ගෙයින් හා සෝදනාගාරයෙන් නිකුත් කරන අපජලය වල අඩංගු තෙල් ඉවත් කිරීම සඳහා නිසි පරිදි සැලසුම් කරන ලද තෙල් උගුල් (oil traps) ඉදිකල යුතු අතර ඒවා නිත්‍ය ලෙස නඩත්තු කල යුතුය.

3.2 මුළුතැන්ගෙයින් හා සෝදනාගාරයෙන් ජනිතවන අපජලය ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත නියමිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව *අභ්‍යන්තර ජලාශවලට මුදාහරින කාර්මික අපජලය සඳහා වන වාරණ සීමාවන්ට අනුකූල වන පරිදි මුදාහැරිය යුතුය.

සැ.යු. *අදාල වන වාරණ සීමා වර්ගය පමණක් තීරණය කොට ඇතුලත් කරන්න.

මෙම කොන්දේසි හෝ පිටපත් මගින් අපජලය ඉවත් කිරීමේ අවස්ථාවකදී නම් සුදුසු පරිදි වෙනස් කළ යුතුය.

04. ආහාර පිසීම සඳහා ඉන්ධන ලෙස දර භාවිතා කරන්නේ නම් එයින් ඇති වන දුමින් අසල්වැසියන්ට පීඩා නොවන පරිදි ප්‍රමාණවත් උසකින් දුම් කවුළුව ( chiminey stack) ඇති කළ යුතුය.

05. කර්මාන්තය තුළ නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැලැක්වීමට පියවර ගත යුතුය.

06. 6.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම උපකරණ නොයෙක් ගෙන පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා පහසුවෙන් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය

6.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි නැවීම වැනි ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

07. ______ දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම බලපත්‍ර පාලන අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

08. ______ දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම බලපත්‍ර පාලන අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇත්ත වශයෙන් තුවාල හෝ අන්‍යදෙමි පරිසර දූෂණ තත්වයක් මතු වෙන්ට ඇතිවී තිබේද මෙම බලපත්‍ර පාලන අධිකාරිය හා පිටතට පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු නැම විටම බැඳී සිටිය යුතු ය.

10. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමඟින් අදාල ප්‍රතිපත්ති අනුකූලව අනුදර්ශ/ අනේකය මුදා හැරීම හා පරිසරයට පැහැදිලිව හා සම්බන්ධ සිමාකිරීමට පමණක් එයින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම බලපත්‍ර පාලන අධිකාරියේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

11. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ....... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් නතර කිරීමකට ලක් වූවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම බලපත්‍ර පාලන අධිකාරිය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

13. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි ක්‍රියාකාරකම් කරනු ලබන ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

14. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් ලේඛනයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම බලපත්‍ර පාලන අධිකාරිය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර දිවා කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුමට්ටමක් ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර රාත්‍රී කාලය තුළ ඩෙසිබල් ...... හෝ එයට අඩුමට්ටමක් ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුගයෙන් තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොකරයි නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක නේවාසිකාගාරයේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes);

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පොලිතීන් අඩංගු කසල හෝ පොලිතින් ද්‍රව්‍ය වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට ඇතුළත්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 නැවත භාවිත අවස්ථාවන්හිදී අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කළ යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කළ යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර ප්‍රශ්නයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය කොන්දේසියන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 නේවාසිකාගාරයේ/ ලැගුම්හලේ ක්‍රියාකාරීත්වයෙන් ජනිත වන අපජලය නාගරික පරිසරය වෙත මුදා හරින්නේ නම් ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත නියමිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව *එට අභ්‍යන්තර ජලාශවලට මුදාහරින කාර්මික අපජලය සඳහා වන වර්ග පිරිවිතර අනුකූලව වන පරිදි ප්‍රතිකාර කළ යුතුය.

සැ.යු. *අදාල වන වර්ග සීමා වර්ගය පමණක් තීරණය කොට ඇතුලත් කරන්න.

මෙම කොන්දේසි යටතේ පිලිසකර කිරීම අපජලය ඉවත් කිරීමේ අවස්ථාවන් නම් සුදුසු පරිදි වෙනස් කල යුතුය.

3.2 නේවාසිකාගාරයෙන් මුළුතැන්ගෙයින් හා ආපනශාලාවෙන් නිකුත් වන අපද්‍රව්‍ය සහිත ඇති ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා නිසි සකසන ලද දැල් පෙරනයක් භාවිතා කළ යුතුය.

3.3 ආපනශාලාවෙන් මුළුතැන්ගෙයින් හා ආහාරශාලාවෙන් නිකුත් කරන අපද්‍රව්‍ය වල අඩංගු තෙල් ඉවත් කිරීම සඳහා නිසි පරිදි සැලසුම් කරන ලද තෙල් උගුල් (oil traps) ඉදිකල යුතු අතර ඒවා නිසා ලෙස නඩත්තු කල යුතුය.

3.4 අලුත්වැඩියාව හා වාහන සේවා ස්ථානවලදී ප්‍රයෝජනයට ගත හැකි අවසාදන ප්‍රතිකාර වලක් ඉදිකල යුතු අතර, සියළුම අපජල කාණුවෙන් (wastewater drains) ඒට සම්බන්ධව සම්බන්ධ කල හැකි විය යුතුය.

04. ආහාර පිසීම සඳහා ඉන්ධන ලෙස දර භාවිතා කරන්නේ නම් එයින් ඇති වන දුමාරය අසල නේවාසිකයින්ට පීඩා නොවන පරිදි ප්‍රමාණවත් උසකින් යුත් දුම් කවුළුව ( chimney stack) ඇති කල යුතුය.

05. 5.1 ආපනශාලාව තුල පිරිසිදු බව සහ සැලසුමක් පවත්වාගෙන යා යුතු අතර, මීයන්/මැස්සන් බෝ වීම වැලැක්වීමට පියවර ගත යුතුය.

5.2 වාහන අළුත්වැඩියාවේදී ක්‍රියා කල යුතු ආකාරය හා ආරක්ෂිතතාවයෙන් පිළිපැදිය යුතු ආකාරය, ගිනි නිවන උපකරණ පිහිටුවා ඇති ස්ථාන හා ආරක්ෂිත ස්ථාන නාම ආදිය ඒ පිළිබඳව සේවකයන්හට පිළිවෙත් සලකුණු පෙන්වා තිබිය යුතුය.

06. 6.1 වාහන අළුත්වැඩියාවේදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ සෑම ගොඩනැගිල්ලේම තිබිය යුතු අතර, ඒවා පහසුවෙන් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය

6.2 ආපනශාලාව තුළ හදිසිය ඇති අවදානම් තත්වයකදී, වාහන අළුත්වැඩියා ගිනි ගැනීම් වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

07. ......... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස්කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

08. ......... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින කුමන හෝ අත්දැකීම් පරිසර දූෂණ තත්වයක් මැඩ පැවැත්වීම පිණිස මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු සෑම විටම බැඳී සිටිය යුතු ය.

10. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමඟින් අදාල ඉඩමින්ට අනුකූලව අයිතියක් ආරෝපණය වීමක් හා පරිසරයට විධිමත්ව හා නෛතික පිළිගැනීමට ඔබ හට වලින් බලය ලැබෙන නොවන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

11. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වූවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

13. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එම ක්‍රියාකාරකම් කරනු ලබන ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

14. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**35. ඩීසල් පින්සාරු කිරීම හෝ වාහන වාෂ්ප සම්පීඩන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හෝ සවි කිරීම සිදු නොකරන වාහන අලුත් වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.**

01. මෙම කර්මාන්තශාලාවේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාළ භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් සවස්වරු 06.00 ත් අතර ඇති කාලය තුළ ඩෙසිබල් ..... හෝ ඊට අඩුවෙන්ද සවස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර ඇති කාලය තුළ ඩෙසිබල් ..... හෝ ඊට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාළ වන ශබ්ද මට්ටම ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් ආශ්‍රයෙන් තීරණය කර අදාළ ස්ථානයේ පෙළදැක්ම, කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට පැවරෙන පරිදි සෙවිය යුතුය.

02. මෙම කර්මාන්තශාලාවේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පොලිතීන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ විවෘත ස්ථාන තුළ එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කළ යුතු අතර, වෙන්කළ ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාළ පළාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කළ යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාළ ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය තත්වයන් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී පිටවන සෞඛ්‍ය අපද්‍රව්‍ය විධිමත් ලෙස සකස් කළ සෙප්ටික් ටැංකි සහ පෙරීම් වළකට (soakage pit) යොමු කළ යුතු අතර , කිසිම අවස්ථාවකදීවත් විවෘත පරිසරයට නිදහස් කිරීම නොකළ යුතුය

04. 4.1 මෙම වැඩපොළේ ක්‍රියාකාරිත්වය නිසා ජනිත වන වායු දූෂකකාරක අවට පරිසරයට එක් වීම වැලැක්වීම සඳහා එම වායු දූෂකකාරක ජනනය වන ස්ථානය මත ලෙස සැලසුම් කරන ලද වායු දූෂකකාරක පාලනය කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය.

4.2 වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ දී නිකාශන වායූන් කිසිවක් බාහිර පරිසරයට මුදා නොහැරිය යුතු අතර, ඒවා එකතු කර ප්‍රතිචක්‍රීකරණය කර නැවත භාවිතා කිරීම සිදු කළ යුතුය.

05. 5.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ ගබඩා පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයින් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය

5.2 සේවාස්ථානය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි ඇතිවීම වැලදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

06. 6.1 වැඩපොළේ ක්‍රියාවලිය සිදු කරනු ලබන ස්ථානයේ පොළව සිමෙන්ති දමා හොඳින් සකස් කළ යුතු අතර, වාහන අළුත්වැඩියා කිරීමේදී පිටවන තෙල් උරා ගැනීම සඳහා ලී කුඩු ස්ථරයක් යෙදීම කළ යුතුය.තෙල් උරා ගත් මෙම ලී කුඩු එම කාලසීමාවන් තුල විධිමත්ව ඉවත් කළ යුතු අතර, මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය ඇතිව කර්මාන්ත සීමිත භූමියෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

6.2 මෙම වැඩපොළේ ක්‍රියාකාරිත්වය මගින් ජනිත වන ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ආරක්ෂිත, ආවරණය කරන ලද ස්ථානයක එක් රැස් කොට තබා ගත යුතු අතර ,පරිසරයට බැහැර කරන්නේ නම් මෙම අධිකාරිය වෙතින් උපදෙස් ලබා ගත යුතුය.

07. මෙම ගරාජය/වැඩපොළ තුළ කර්මාන්තය තුළ නිවාස රැක සැලසුමක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැලැක්වීමට පියවර ගත යුතුය.

08. මාර්ගයට අවහිරයක් නොවන පරිදි සේවා පහසුකම් ලබා ගැනීම සඳහා පැමිණෙන වාහන නවත්වා තැබීම පිණිස ප්‍රමාණවත් ඉඩ පහසුකම් කර්මාන්ත භූමිය තුල පවත්වා ගත යුතුය.

09. මෙම ගරාජයේ/වැඩපොළේ වැඩ කරන සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කර්මාන්තශාලා ආඥා පනතේ හා එහි සංශෝධනයන්හි අඩංගු නීති හා රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය.

10. ............ දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරිත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

11. ............ දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

12. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන ඕනෑම හෝ අනපේක්ෂිත පරිසර දූෂණ තත්වයක් මැඩ පවත්වා ගැනීම පිණිස මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු සැම විටම බැඳී සිටිය යුතු ය.

13. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාල ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය/ අපද්‍රව්‍ය මුදා හැරීම හා පරිසරයට වායුදූෂකකාරක හා ශබ්දය විමෝචනය කිරීමට පමණක් මෙයින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

14. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

15. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

16. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එම ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

17. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

36 **විශාල ශබ්ද සිදු නොකරන මහාලුම් (කන්ටේනර්) කර්මාන්ත.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර සේවා කාලය තුල ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර සේවා කාලය තුල ඩෙසිබල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල විශාල ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති කලාප වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුකූලව තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන කසළ සහ අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට වහනය විය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පොලිතීන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුල හෝ වටපිටාව තුල එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 නැවත ලබා ගැනීමේ අවස්ථාවේදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කල යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කල යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මඟපෙන්වීම යටතේ බැහැර කල යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය ගනිමින් කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය කන්ටේනර් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. 3.1 මෙම ස්ථානයේ කිසිම විටක අපද්‍රව්‍ය දහනය වන කර්මාන්ත ක්‍රියාකාරකම් සිදු නොකල යුතුය.

3.2 සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී ජනිත වන සියළුම ගෘහාශ්‍රිත අපද්‍රව්‍ය (domestic liquid waste) නිසි ලෙස සකසන ලද සැලසුමකින් යුතු උරා ගැනීමේ වළකට (soakage pit) යොමු කළ යුතු අතර , කිසිම විටෙක නිදහසේ විවෘත පරිසරයට මුදා නොහැරිය යුතුය.

04. 4.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ සෙසු ස්ථාන පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයන් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය.

4.2 කර්මාන්ත ආයතනය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි නැගීම් වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවීම සමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

05. 5.1 භාණ්ඩ පොඩිකිරීම, තැටවීම හා ගබඩා කරන ස්ථාන වලින් දූවිලි, වාතයට එක් වීම පාලනය කල හැකි ක්‍රමවේද අනුගමනය කල යුතුය.

5.2 කර්මාන්ත වල ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය හා ඉවතින් ඉතිරි හෝ විසිරීගිය ද්‍රව්‍ය පිළිබඳව දැඩි අවධානයක් යොමු කල යුතු අතර, 2008 අංක 1534/18 දරණ ගැසට් නිවේදනයේ VIII වන උපලේඛනයට අදාල පොදුවිය එම කර්මාන්ත තුළ අඩංගු නම් ඒ සඳහා අදාල බලපත්‍රය මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබා ගත යුතුය.

06. කර්මාන්ත ආයතනය තුළ නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

07. .......... දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම වෙනස්කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

08. .......... දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. මෙම කර්මාන්ත ආයතනය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන කිසියම් හෝ අන්දමේ පරිසර දූෂණ තත්වයක් මැඩ පවත්වා ගැනීම පිණිස මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු හැම විටම බැඳී සිටිය යුතු ය.

10. මෙම කර්මාන්ත ආයතනය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාල ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය/ අපද්‍රව්‍ය මුදා හැරීම හා පරිසරයට වගකීමෙන් තොරව හා නෛතික පිළිගැනීමට පමණක් එයින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

11. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වූවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

13. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අරමුණ ලක් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි

ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා අයිතිවාසිකම් කිරීමට අදහස් නොකළ යුතුය.

14. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත මඟින් හෝ වෙනත් අයුරකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

## 37 ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර සේවා කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ ඊට අඩුවෙන්ද පස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර සේවා කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ ඊට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති සීමිත වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුගෙන් තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන කසළ සහ අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට සම්බන්ධ විය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසල හෝ පොලිතීන් දැවෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ වටපිටාව තුළ එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කල යුතු අතර, වෙන්කල ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කල යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පළාත් පාලන ආයතනයේ මඟපෙන්වීම යටතේ බැහැර කල යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / එකතුකිරීම සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇති වීම හා පැතිරීම වැලැක්වීමට අවශ්‍ය තත්ත්වයන් භූමිය තුළදී හා ඉන් පිටතදී පවත්වා ගත යුතුය.

03. 3.1 අපද්‍රව්‍ය ලෙස ද්‍රාවක (භූමිතෙල්) මිශ්‍රිත ජලය ජනනය වීම හැකිතාක් අවම කල යුතු වේ.

3.2 අපද්‍රව්‍ය ලෙස කිසිවිටකත් ද්‍රාවක (භූමිතෙල්) අඩංගු ජලය පරිසරයට මුදා නොහැරිය යුතුය.

3.3 සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් පසුව එන සියළුම ගෘහාශ්‍රිත අපද්‍රව්‍ය (domestic liquid waste) නිසි ලෙස සකසන ලද සැලසුම්වලින් යුතු උරා ගැනීමේ වළකට (soakage pit) යොමු කළ යුතු අතර , කිසිම විටෙක නිදහසේ පිටත පරිසරයට මුදා නොහැරිය යුතුය.

04. කාබනික ද්‍රාව්‍ය වාෂ්ප වාතයට මුදා වීම අවම කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගත යුතුය

05. හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ එම ගබඩා පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයින් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය.

06. කර්මාන්තය තුළ නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

07. ........ දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස්කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

08. ........ දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස යම් තැනක ඝෝෂා දුම හෝ ජෛවමය පරිසර දූෂණ තත්වයක් මතු වුවහොත් ඒවා පාලනය කිරීම පිණිස මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතු ය.

10. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමගින් අදාළ ප්‍රමිතීන්ට අනුකූලව අපජලය/ අපද්‍රව්‍ය මුදා හැරීම හා පරිසරයට විමෝචක හා ශබ්දය පිටකිරීමට පමණක් එමගින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

11. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ....... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාළ බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

13. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් ලෙසට ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එකී ක්‍රියාකාරකම් කරනු ලබන ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

14. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මගින් හෝ වෙනත් ලේඛනවලින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව කිසියම් අවස්ථාවක සොයාගනු ලැබුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

38. මහා පරිමාණ තල් තබා පැසීමට සකස් කිරීම සහිත මිල් හාලා.

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාළ භූමියේ මායිම්වලදී පෙරවරු 06.00 සිට පස්වරු 06.00 දක්වා දහවල් කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ එයට අඩුවෙන්ද පස්වරු 06.00 සිට පෙරවරු 06.00 දක්වා රාත්‍රී කාලය තුළ ඩෙසිබෙල් ...... හෝ එයට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාළ වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ නියම කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග වලින් 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුගයෙන් තීරණය කර අදාළ ස්ථානයේ පෙදෙසින. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම් දිවා කාලයට පමණක් සඳහන් කළ යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes):

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 කර්මාන්ත බිම්ට භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.3 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසල හෝ පොලිතීන් දහනය වන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුළ හෝ පරිසරයට තුළ එළිමහනේ පිළිස්සීමෙන් ... තහනම් වේ.

2.4 හැකි සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන්කළ යුතු අතර, වෙන්කළ ද්‍රව්‍ය නැවත භාවිතයට හෝ ප්‍රතිචක්‍රීකරණයට හෝ යොමු කළ යුතුය.

2.5 ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය පමණක් අදාළ පළාත් පාලන ආයතනයේ මඟපෙන්වීම යටතේ බැහැර කළ යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්ත බිම්ට භූමියෙන් පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම / ශේෂනයක් සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාළ ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය කන්ටේනර් භූමිය තුළ හා ඉන් පිට දී පවත්වා ගත යුතුය.

03. සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී ජනිත වන සියළුම ගෘහස්ථ අපද්‍රව (domestic liquid waste) ඇතුළු මිල් ශාලාවේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන අපද්‍රව ප්‍රමිතියට අනුකූලව සකස් කරන ලද පූතික වළකට (Septic tank) මුදාහැරීමට පියවර ගතයුතු අතර, කිසිම විටෙක නිදහසේ විවෘත පරිසරයට මුදා නොහැරිය යුතුය.

04. මිල් ශාලාවේ ක්‍රියාකාරීත්වයේදී ඉවත් කරන පෙරීම් හා උපකරණ පරිසර දූෂණයක් සිදු නොවන ආකාරයට ආරක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව බැහැර කිරීමට පියවර ගතයුතුය.

05. කර්මාන්තයේ භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ඇතුළු අමුද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වෙනම ගබඩා කාමර තිබිය යුතු අතර, ඉහිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.

06. 6.1 ගිනි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ ගබඩා පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා පහසුවෙන් භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය.

6.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි ඇතිවීම වලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

07. කර්මාන්තය තුල නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු, අතර මදුරුවන් බෝ වීම වැළැක්වීමට පියවර ගත යුතුය.

08. මෙම කර්මාන්තය තුල වැඩ කරන සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කර්මාන්තශාලා ආඥා පනතේ හා එහි සංශෝධනයන්හි අඩංගු නීති හා රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය.

09. ........ දිනැති අනුමැතියෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරිත්වයේ සීමාව වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

10. ........ දිනැති අනුමැතියෙහි සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

11. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස යම් [illegible] හෝ පෞද්ගලික පරිසර දූෂණ තත්වයක් හෝ [illegible] මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා වරින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරු සෑම විටම බැඳී සිටිය යුතු ය.

12. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන හෙයින්ද, මෙමගින් අදාල [illegible] අයිතිවාසිකම්/ අයිතිය [illegible] හා පරිසරයට [illegible] විසින් බලය ලැබෙන්නා හෙයින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

13. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............ කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

14. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

15. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අවසර ලත් ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ.එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදාළ නොකළ යුතුය.

16. කර්මාන්තකරු විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත සමග හෝ වෙනත් [illegible] සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව [illegible] අනාවරණය වුවහොත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය.

**39. මෙම උපලේඛනයේ " ඇ " කොටසේ ඇතුලත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින සියලුම ක්‍රියාකාරකම්/කර්මාන්තයන්.**

01. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය නිසා ජනිතවන ශබ්දය අදාල ඉඩමේ මායිමේදී පෙරවරු 06.00 ත් සවස්වරු 06.00 ත් අතර සේවා කාලය තුල ඩෙසිබෙල් ..... හෝ ඊට අඩුවෙන්ද සවස්වරු 06.00 ත් පෙරවරු 06.00 ත් අතර සේවා කාලය තුල ඩෙසිබෙල් ..... හෝ ඊට අඩුවෙන්ද පවත්වාගත යුතුය.

සැ.යු. අදාල වන ශබ්ද මට්ටම් ප්‍රමාණය 1996 මැයි 23 දිනැති අංක 924/12 දරණ ගැසට් නිවේදනයේ ප්‍රකාශ කර ඇති 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ශබ්ද පාලන) නියෝග පරිදි 1 වන උපලේඛනයේ දක්වා ඇති මායිම් වල අවසර දිය හැකි උපරිම ශබ්ද මට්ටම් අනුගයෙන් තීරණය කර අදාල ස්ථානයේ යොදන්න. කර්මාන්තය රාත්‍රී කාලයේදී ක්‍රියාත්මක නොවේ නම් ශබ්ද මට්ටම දිවා කාලයට ගැලපෙන පරිදි යෙදිය යුතුය.

02. මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් සහ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයෙන් ජනිත වන සියළුම ඝන අපද්‍රව්‍ය (Solid wastes);

2.1 කිසිම ජල මාර්ගයකට/ ජලාශයකට හෝ ජල මාර්ගයකට/ ජලාශයකට එකතුවිය හැකි ස්ථානයකට බැහැර නොකළ යුතුයි.

2.2 අදාල පලාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියේ කවර හෝ පරිසර ප්‍රශ්නයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගත යුතුය.

2.3 කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතුයි.

2.4 අංක 2034/36 හා 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ප්ලාස්ටික් අඩංගු කසල හෝ ශාකමයවෙන් ලැබෙන වෙනත් ද්‍රව්‍ය කර්මාන්ත පරිශ්‍රය තුල හෝ පරිසරය තුල එළිමහනේ පිළිස්සීමට සැලැස්වීමට ඉඩදීම හෝ අවසරදීම තහනම් වේ.

2.5 ඝන අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැරලීම සිදු නොකල යුතු අතර,නැතිනම් ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කල හැකි ද්‍රව්‍ය වෙන් කර ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පමණක් අදාල පලාත් පාලන ආයතනයේ මගපෙන්වීම යටතේ බැහැර කල යුතුය.

2.6 කර්මාන්තශාලාවෙන් පිටත වෙනත් භූමියකට බැහැර කරන්නේ නම් ඒ සඳහා මෙම පලාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතිය සහිතව කර්මාන්තය පිහිටි භූමියෙන් පරිසර ප්‍රශ්නයක් සිදු නොවන ආකාරයට ඉවත් කිරීමට පියවර ගතයුතුය.

2.7 ඝන අපද්‍රව්‍ය බැහැරලීම රැගෙන යාම සඳහා තුන්වන පාර්ශවයකට කොන්ත්‍රාත්තුවක් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්කරු අදාල ආයතන වලින් විධිමත් අනුමැතියක් ලබා තිබිය යුතුය.

2.8 ඝන අපද්‍රව්‍ය නිසා දුර්ගන්ධය ඇතිවීම හා පැතිරීම වැළැක්වීමට අවශ්‍ය පහසුකම් නිසි ආකාරයෙන් පවත්වා ගත යුතුය.

03. 3.1 කර්මාන්තයේ සේවක සේවිකාවන්ගේ පරිභෝජනයේදී ජනනය වන සියළුම ගෘහාශ්‍රිත අපජලය සුදුසු පරිදි සකසන ලද පූතික වැංකියකට/ උරා ගැනීමේ වළකට යොමු කළ යුතු අතර , කිසිම විටක මතුපිට පරිසරයට නිදහසේ ගලා යාමට ඉඩ නොදිය යුතුය.

3.2 කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයෙන් ජනනය වන අපජලය නියමිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව ඊට අභ්‍යන්තර ජලය වලට මුදා හරින කාර්මික අපජලය සඳහා වන පාරිසරික ප්‍රමිතීන්/ වාරිමාර්ග කටයුතු සඳහා භාවිතා කරනු ලබන භූමි වලට මුදා හරින කාර්මික අපජලය සඳහා වන පාරිසරික ප්‍රමිතීන්/ පොදු කාණු පද්ධතියට මුදා හරින කාර්මික අපජලය සඳහා පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව මුදා හැරිය යුතුය.

සැ.යු. *අදාල වන පාරිසරික ප්‍රමිති මට්ටම පමණක් තීරණය කොට ඇතුලත් කරන්න.

කාර්මික අපද්‍රව්‍ය ජනනය වන කර්මාන්තයක් පමණක් නම් මෙම කොන්දේසිය ඇතුළත් කරන්න.

04. කර්මාන්තශාලාවේ භාවිතා කරන බොයිලේරු / උදුන සඳහා වන චිමිනිය අවම වශයෙන් අඩි 30 ක් හෝ ආසන්නතම ගොඩනැගිල්ලේ වහලය මට්ටමට වඩා අවම වශයෙන් අඩි 8ක් වත් උසින් පිහිටිය යුතුය.

සැ.යු. වායු දූෂණය ජනනය වන ක්‍රියාකාරීත්වයක් නම් පමණක් අවශ්‍යතාවය සලකා මෙම කොන්දේසිය යොදන්න.

05. කර්මාන්තය තුල නිසි ගෘහ පාලනයක් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හෝ මීයන් බෝවීම වැලැක්වීමට පියවර ගත යුතුය.

06. 6.1 හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ ගොඩනැගිලි පරිශ්‍රයේ තිබිය යුතු අතර, ඒවා සේවකයින්ට භාවිතා කළ හැකි පරිදි තබා ගත යුතුය.

6.2 කර්මාන්තය තුළ ඇතිවිය හැකි අවදානම් තත්වයකදී, හදිසි අවස්ථාවක ගිනි ඇතිවීම වැනි ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ සැලසුම් හා උපදෙස් අදාල ගිනි නිවන හමුදා ඒකක වලින් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.

07. මෙම කර්මාන්තය තුල වැඩ කරන සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කර්මාන්තශාලා ආඥා පනත් හා එහි සංශෝධනයන්හි අදාල නීති හා රෙගුලාසි අනුව ක්‍රියා කළ යුතුය.

08. ........ දිනැති අයදුම්පතෙහි සඳහන් ක්‍රියාවලියේ හෝ ක්‍රියාකාරීත්වයේ කිසියම් වෙනස් කිරීමක් හෝ පුළුල් කිරීමක් මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

09. ........ දිනැති අයදුම්පතේ සඳහන් යන්ත්‍රසූත්‍රවලට අමතරව වෙනත් යන්ත්‍රසූත්‍ර සවිකිරීම හෝ ක්‍රියා කරවීම මෙම පළාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

10. මෙම කර්මාන්තය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි කුමන හෝ අන්දමේ පරිසර දූෂණ තත්වයක් හට ගන්නේ නම් එවිට මෙම පළාත් පාලන ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර දූෂණ පාලනය සඳහා විසින් වර කරනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අප්‍රමාදව, නැත විටක නැදී සිටිය යුතු ය.

11. මෙම කර්මාන්තය සඳහා නිකුත් කරනු ලබන මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය එම කර්මාන්තය පවත්වාගෙන යාම සම්බන්ධව නිකුත් කරනු ලබන බලපත්‍රයක් නොවන බැවින්ද, මෙමඟින් අදාල ප්‍රමිතීන්ට අනුකූලව අපජලය/ අපද්‍රව්‍ය මුදා හැරීම හා පරිසරයට විමෝචනයන් හා ශබ්දය පිටකිරීමට පමණක් මෙයින් බලය ලැබෙන බැවින්ද, මෙම කර්මාන්තය මෙම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා මෙම පළාත් පාලන ආයතනයේ ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු ය.

12. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ...... යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ............. කර්මාන්තය සඳහා පමණක් බව සැලකිය යුතු ය.

13. මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය බල රහිත කිරීමක්, අත්හිටුවීමක්, අවලංගු කිරීමක් හෝ වෙනත් අධිකරණමය ක්‍රියාවලියකින් තහනම් කිරීමකට ලක් වුවහොත් අදාල බලපත්‍රයේ මුල් පිටපත මෙම පළාත් පාලන ආයතනය වෙත භාර දීමට කර්මාන්තකරු පියවර ගත යුතු ය.

14. මෙම පරිසර ආරක්ෂණ බලපත්‍රය එහි සඳහන් අයුරු ලෙස ක්‍රියාකාරකම් කිරීම සඳහා පමණක් නිකුත් කරනු ලැබේ. එය මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබන්නාට එහි ක්‍රියාකාරකම් කරනු ලබන භූමිය සඳහා කිසිදු අයිතිවාසිකමක් ලබා නොදෙන අතර ඒ සඳහා ඉදිරිපත් කිරීමට අදහස් නොකළ යුතුය.

15. කර්මාන්තකරු විසින් තාක්ෂනික ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත මඟින් හෝ වෙනත් ආකාරයකින් සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය සහ / හෝ වැරදි බව තීරණය අවස්ථාවක අනාවරණය වුවහොත් තාක්ෂනික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය මෙම පළාත් පාලන ආයතනය සතුවන අතර, එම අයිතියට යටත්ව මෙම බලපත්‍රය නිකුත් කරනු ලබන බව සැලකිය යුතුය

***** සැ.යු. කර්මාන්තයේ ස්වාභාවය අනුව මෙම කොන්දේසි ඇතුලත් කිරීම හෝ නොකිරීම කල යුතු අතර අවශ්‍ය පරිදි වැඩි මනත් කොන්දේසි ඇතුලත් කල යුතුය.**

# <u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ක්ෂුද්‍ර කර්මාන්තයන් හා අවිධිමත් ව්‍යාපාරයන් පිළිබඳ ගෙන ඇතිගෙන ඇති අභ්‍යන්තර ප්‍රතිපත්තීන්</u>

# පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ක්ෂුද්‍ර කර්මාන්තයන් හා අවිධිමත් ව්‍යාපාරයන් පිළිබඳ ගෙන ඇතිගෙන ඇති අභ්‍යන්තර ප්‍රතිපත්තීන්

පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය විධිමත් ලෙස ඉටු කිරීම සඳහා 2000 අංක 53 හා 1988 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත වර්ෂ 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 2264/18 හා 2022-01-27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පාරිසරික පනතේ විධිවිධාන වලට අනුකූලව ඇ කාණ්ඩයට අයත් ව්‍යාපාරයන් 39 සඳහා බලපත්‍ර ලබාදීමට පළාත් පාලන ආයතනයන්ට බලය පවරා ඇති ආකාරයට කටයුතු සිදුකළ යුතු වේ. එබැවින් එම බලතල වෙනස් නොකරන අතර එයට නව අදහස් එකතු කිරීම පමණක් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදු කරයි.

- පරිසර කමිටුව සඳහා සහභාගීවන නිළධාරීන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පහත ලෙස නම් කර ඇත.

  පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්
  මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර නිළධාරී
  ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු
  පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරීවරුන්
  පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පරිසර විෂය නිළධාරී

- පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට නොහැකි ඇ කාණ්ඩයට අයත් ව්‍යාපාරයන්ගෙන් කුඩා පරිමාන පරිසර බලපත්‍ර ලබා දිය හැකි ව්‍යාපාරයන් පරිසර බලපත්‍රයක් අයදුම් කල හොත් ක්ෂුද්‍ර කර්මාන්ත යටතේ අවිධිමත් නොවන්නේ නම් ස්ථාන පරීක්ෂා කර සලකා බලා පරිසරය හානියක් සිදු නොවන්නේ නම් ඇ කාණ්ඩයේ 39 අංක යටතේ ක්ෂුද්‍ර හා අවිධිමත් කාණ්ඩය යටතේ පරිසර කමිටු අනුමැතිය සහිතව පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු සිදු කරයි.

- ක්ෂුද්‍ර හා අවිධිමත් කාණ්ඩය යටතේ පරිසරයට බලපෑම් සිදුවන ආයතනයකින් පරිසර බලපත්‍ර අයදුම් කල හොත් පරිසරයට හිතකාමීද යන්න පෙර පරීක්ෂාව අවශ්‍ය බැවින් පරිසර නිර්දේශයක් ලබා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කිරීම.

- ක්ෂුද්‍ර හා අවිධිමත් කාණ්ඩය යටතේ පරිසරයට බලපෑම් සිදුවන ආයතනයකින් පරිසර බලපත්‍ර අයදුම් කල හොත් පරිසරයට හිතකාමීද යන්න පෙර පරීක්ෂාව අවශ්‍ය බැවින් ගොඩනැගිලි අනුමැතිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පරිසර බලපත්‍රය ලබා දීම.

## **පැල්මඩුල්ල ප්‍රාදේශීය** සභාවේ අභ්‍යන්තර පාරිසරික ප්‍රතිපත්තිය සඳහා

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහයවීමේ කමිටුවේ නිර්දේශය -:

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාගේ අනුමැතිය - :

ප්‍රජා සංවර්ධන නිළධාරීතුමියගේ අධීකෂණය -:

පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අදහස් හා යෝජනා -:

පළාත් පාලන කොමසාරිස්තුමාගේ අදහස් හා යෝජනා -: